## කොළඹ විශ්වවිද්‍යාලය - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

**සම්පූර්ණයෙන් ක්ෂය කළ වත්කම්**

විශ්වවිද්‍යාලය සතුව එකතු වටිනාකම රු.212,758,120 ක් වූ දැනට ප්‍රයෝජනයට ගන්නා එහෙත් සම්පර්ණයෙන් ක්ෂය කළ වත්කම් ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර සාධාරණ අගයකට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හෙළිදරව් කර නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කිරීමේදී පහත සඳහන් ගණම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ලැබූ රු.9,870,322 ක් වූ බාහිර පාඨමාලා අයදුම්පත් ගාස්තු හා රු.18,640,016 ක් වූ ලියාපදිංචි ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කළයුතු වුවත් , රු.961,500 ක් වූ අයදුම්පත් ගාස්තු හා රු.3,272,500 ක් වූ ලියාපදිංචි ගාස්තු ජංගම නොවන වගකීම් යටතේ විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය මගින් මෙහෙයවනු ලබන ආසියානු පැසිපික් කලාපීය රටවල් අතර මානව හමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ 2011/2012 පශ්චාත් උපාධි පාඨමාලාව (Asia Pacific Masters) 2012 අප්‍රේල් 27 දින අවසන්වී තිබූ නමුත් ඉකුත් වර්ෂවලට අදාල ආදායම නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. සමාලෝචිත කාලපරිච්ඡේදයට අදාල වූ ඉදිරියට ගෙනා සහ සමාලෝචිත වර්ෂය තුළ ලැබූ ආදායම ඇතුළුව රු. 12,075,047 ක මුළු ආදායම වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වර්ෂය තුළ මුදලින් ලැබූ රු.1,315,073 ක් පමණක් ආදායම් ලෙස සලකා තිබුණි. එමෙන්ම තව දුරටත් අනුචිත ලෙස රු. 4,146,366 ක් විලම්භීත කර ඉදිරියට ගෙන ගොස් තිබුණි.

(ඇ) කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨය මගින් පවත්වනු ලබන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ 2010/2011 කණ්ඩායමේ ඉගැන්වීම් කටයුතු 2012 දෙසැම්බර් 31 දින අවසන් වී තිබූ නමුත් ඒ සම්බන්ධව ඉකුත් වර්ෂ වලට අදාළ ආදායම නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව මෙතෙක් ඉදිරියට ගෙනා සමුච්චිත ආදායම හා වර්ෂය තුළ මුදලින් ලද ආදායම වූ රු.16,794,002 වර්ෂයේ ආදායම ලෙස හඳුනාගත යුතුව තිබූ නමුත් ඒ වෙනුවට ආදායම ලෙස හඳුනාගෙන තිබුනේ රු. 720,850 පමණි. එමෙන්ම ඉදිරියේදී තවදුරටත් ගුරු පුහුණුව සඳහා දැරීමට අපේක්ෂිත රු.3,150,000 වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සිදු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට පාඨමාලා 74 ක අතිරික්ත ආදායම වූ රු.71,520,554 ක මුදල විශ්වවිද්‍යාල අරමුදලට බැර කරනු වෙනුවට උපාධි අධ්‍යයන පීඨ ගොඩනැගිලි අරමුදලට බැරකර තිබුණි.

### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

පර්ක්ෂාකල ආචාර්යවරු 100 දෙනකුගෙන් යුත් නියැදියේ ඇතුළත් ආචාර්යවරු 15 දෙනකු සම්බන්ධයෙන් අදාල පර්යේෂණ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණු අතර එම ආචාර්යවරුන් සඳහා පර්යේෂණ දීමනා වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.1,480,177 ක් ගෙවා තිබුණි.

### 1.2.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

---

අන්තර් ජංගම ගිණුම් අතර තිබෙන ශේෂයන් වර්ෂය අවසානයේ දී පියවීමට කටයුතු නොකර පාඨමාලා 217 ක අතිරික්ත ආදායම වූ රු.124,038,130 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ණය ගැතියන් හා ණය හිමියන් වශයෙන් දක්වා තිබුණි.

### 1.2.5 නීති,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති,රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 6(1)(අ) වගන්තිය | පිරිවැය රු. මිලියන 5 ඉක්මවන කොන්ත්‍රාත් ගිවිසුම් වලදී සෑම ටෙන්ඩර් කරුවෙකුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කළයුතු වුවත්, රු.20,204,939 ක් පිරිවැය වූ නව කලාගාරය අලුත්වැඩියාව හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය හා රු.9,026,077 ක් පිරිවැය වූ විද්‍යා පීඨ උද්‍යාන අලංකරණ ව්‍යාපෘතියට අදාල කොන්ත්‍රාත්කරුවන් එසේ ලියාපදිංචි කර නොතිබුණි. |
| (ආ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99(1) උපවගන්තිය | (i) විශ්වවිද්‍යාලයේ සියළුම උත්පාදක ආදායම් ඇතුළුව සියළුම අරමුදල් විශ්වවිද්‍යාල අරමුදලේ කොටසක් වියයුතු වුවද ඊට පටහැනිව භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව පාලක සභා තීරණ යටතේ කොළඹ විශ්වවිද්‍යාලීය සංවර්ධන අරමුදල පිහිටුවීමට කටයුතු කර තිබුණි.<br><br>(ii) විශ්වවිද්‍යාල මූල්‍ය කමිටුවේ නිර්දේශ මත විවිධ පීඨ හා දෙපාර්තමේන්තු සඳහා සංවර්ධන අරමුදල් පිහිටවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එම අරමුදල් 75 ක රු.119,069,767 ක් රැස්කර තිබු අතර වියදම රු.73,754,623 ක් විය. |

| | | |
|---|---|---|
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 මාර්ගෝපදේශය | තාක්ෂණ ඇගයීම් කමිටුවේ අදාල විෂය සම්බන්ධ විශේෂඥ සාමාජිකයෙකු සිටියයුතු වුවත්, කොන්ත්‍රාත් වටිනාකම රු.20,204,939 ක් වූ නව කලගාරය අලුත්වැඩියාව හා වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා පත්කර තිබූ තාක්ෂණික ඇගයීම් කමිටුවේ එවැනි සාමාජිකයෙක් පත්කර නොතිබුණි. |
| (ඈ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 5.2 වගන්තිය හා 2007 අගෝස්තු 24 දිනැති අංක. 09/2007(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | අනධ්‍යයන කාර්ය මණ්ඩලයට උපරිම වශයෙන් වයස අවුරුදු 60 දක්වා සේවය කළ හැකි අතර එසේ විශ්‍රාම ගිය නිලධාරියෙකු මාස 12 ක උපරිමයකට යටත්ව නැවත සේවයේ යෙදවිය හැකිය. එම සීමාවන් ඉක්මවා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 3 දෙනෙකු අවුරුදු 01 සිට අවුරුදු 04 දක්වා කාලයක් අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සේවයේ යොදවා තිබුණි. |
| (ඉ) | 2011 අප්‍රේල් 07 දිනැති අංක 45 දරන කළමණාකරන සේවා චක්‍රලේඛය | පිළිගත් පර්යේෂණ කමිටුවක අනුමැතිය නොලබා ආචාර්යවරුන් 502 දෙනෙකුට පර්යේෂණ දීමනා ලෙස රු.58,366,090 ක් ගෙවා තිබුණි. තවද ඉහත ආචාර්යවරුන්ගෙන් ආචාර්යවරු 07 දෙනෙකු පර්යේෂණ කටයුතුවල නියැලී නොතිබූ අතර ඔවුන්ට සමාලෝචිත වර්ෂය තුලදී රු.524,571 ක පර්යේෂණ දීමනාවක් ගෙවා තිබුණි. |
| (ඊ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය හා X පරිඡේදයේ 1.6.1 වගන්තිය. | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම , පිටවීම හා නිවාඩු සනාථ කර ගැනීම සඳහා අදාල පොත්පත්, ලේඛණ නඩත්තු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා ගෙවූ රු. 587,716,629 ක් වූ වැටුප් හා දීමනාවල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.1,280,656,942 ක ඌනතාවයක් වු අතර, ඉකුත් වර්ෂයේ අනුරූපී ඌනතාවය රු.1,194,550,697 ක් විය. පුනරාවර්තන වියදම් සහ නඩත්තු වියදම් සඳහා රු.1,313,690,377 ක් වු රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.33,033,435 ක අතිරික්තයක් බවට පත්ව තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.1,263,933,516 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂයේ අතිරික්තය රු.69,382,819 ක් දක්වා වැඩි වී තිබුණි.ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු මූල්‍ය ප්‍රතිඵලයේ රු.36,349,384 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කළමනාකරණ අකාර්යක්ෂමතා

භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාල පාලක සභා සංදේශ අංක. එම් 88/10 යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල සඳහා ආදායම් ප්‍රභවයන් වනුයේ බාහිර පාඨමාලාවල අතිරික්තය හා කොතලාවල ආරක්ෂක විද්‍යාලයේ උපදේශන ගාස්තු වේ. එකී නියමයන්ද අභිබවා යමින් 2000 ඔක්තෝබර් 21 දිනැති අංක. 21 දරණ කොළඹ විශ්වවිද්‍යාලීය චක්‍රලේඛය මගින් බාහිර පාඨමාලා අයවැයගත ආදායමෙන් සියයට 10 ලෙස සමාලෝචිත වර්ෂය තුළ රු.26,775,342 ක් විවිධ පීඨ මගින් සංවර්ධන අරමුදලට බැර කර තිබුණි . බාහිර පාඨමාලා ආදායම් කළමනාකරණය සම්බන්ධයෙන් කලමනාකරණයේ ඉහත පරස්පරතාවයන් මූල්‍ය පාලනයෙ අහිතකර තත්ත්වයක් බව නිරීක්ෂණය විය.

### 3.2 ගිවිසුම් ගත සේවා

සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ ආරක්ෂක සේවා සඳහා රු.30,314,352 ක් ගෙවා තිබූ අතර 2012 දෙසැම්බර් 04 දින පෙරවරු 11.00 පමණ සිදුකළ භෞතික පරීක්ෂාවේදී ආරක්ෂක නිලධාරීන

අනුයුක්ත කළයුතු සැලැස්මට අනුව ස්ථාන 09 ක නිලධාරීන් 12 ක් සේවයේ යොදවා නොතිබූ බව නිරීක්ෂණය විය.

3.3 **ගිවිසුම් කඩකළ අචාර්යවරුන්ගෙන් ලැබියයුතු මුදල්**

-------------------------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට විශ්වවිද්‍යාල ආචාර්යවරුන් 37 ක් ගිවිසුම් කඩකර තිබූ අතර විශ්වවිද්‍යාලයට අයවීමට තිබූ මුලු මුදල රු.41,597,721 ක් විය.

ආචාර්යවරයා පිළිබඳ තොරතුරු සොයාගත නොහැකිවීම සහ අධිකරණ නියෝග ලබාදී තිබුණද ඒ අනුව කටයුතු කිරීමට අපොහොසත්වීම නිසා ආචාර්යවරුන් 11 ක ගෙන් අයවියයුතු රු.11,966,890 ක් ද විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකිරීමට කටයුතු කරන බව දක්වා තිබූ ආචාර්යවරු 13 ක ගෙන් අයවියයුතු රු.4,337,122 ක් ද සේවය කඩකළ ආචාර්යවරියගෙන් අයවියයුතු රු.1,790,241 ක් ද දීර්ඝකාලයක සිට අයවී නොතිබුණි.

3.4. **නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) උපාධි අධ්‍යයන පීඨයේ සවිකර ඇති රු.350,000 ක් පිරිවැය වූ විදුලි උත්පාදන යන්ත්‍රය වසර 07 ක සිට නිශ්ක්‍රියව පැවතුණි.

(ආ) වෛද්‍ය සායනික ගොඩනැගිල්ල සඳහා රු.13,268,669 ක කාර්යාල උපකරණ මිලදී ගෙන තිබූ අතර ගොඩනැගිල්ලේ කොන්ත්‍රාත් කටයුතු අවසන් වීමට ප්‍රථම උපකරණ මිලදීගැනීම නිසා වසර 1 1/2 කට අධික කාලයක් නිශ්ක්‍රියව පැවතුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ අනුමත රියදුරු කාර්යමණ්ඩලය 24 ක් වන අතර තථ්‍ය කාර්යමණ්ඩලය 21කි. ඒ අනුව පුරප්පාඩු තනතුරු ගණන 3කි. උපකුලපති සඳහා එක් වාහනයක්ද අනෙකුත් කාර්යමණ්ඩලය සඳහා වාහන 10 ක් ද වෛද්‍ය පීඨය සඳහා අතිරේක වාහන 5 ක් ද වශයෙන් වෙන් කළ මුළු වාහන සංඛ්‍යාව හා රියදුරන් සංඛ්‍යාව 16 කි. වාහන 32 ක ඇණියෙන් ඉතිරි වාහන 16 පැදවීම සඳහා යෙදවිය හැකි රියදුරන් ගණන 5 ක් පමණක් විය. විශ්වවිද්‍යාලයේ අනෙකත් අංශයන්හි කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට මෙම තත්ත්වය බාධාවක් වන අතර සැමවිටම වාහන 11 ක් ඌණ උපයෝජිතව පැවතුණි.

3.5 **කොන්ත්‍රාත් පාලනයෙ අකාර්යක්ෂමතා**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෛද්‍ය පීඨයේ සායනික විද්‍යා අංශයේ ඉගෙනුම් හා විභාග කටයුතු සඳහා ඉදිකරනු ලබන ගොඩනැගිල්ල සඳහා වූ කොන්ත්‍රාත්තුව පෞද්ගලික කොන්ත්‍රාත් සමාගමකට 2004 දෙසැම්බර් 17 දින කොන්ත්‍රාත් වටිනාකම රු.47,644,945 කට ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව මාස 18 කින් අවසන් කිරීමට සැලසුම් කර තිබුණද , වසර 08 කට අධික කාලයක් ඉකුත් වී 2013 අප්‍රේල් 08 දින කොන්ත්‍රාත් කටයුතු නිම කර තිබුණි. මෙම ඉදිකිරීම් සඳහා රු.92,353,867 ක වියදමක් විශ්වවිද්‍යාලය විසින් දරා තිබූ අතර එය මූලික කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 93.8 ක් ඉක්මයාමකි.

(ආ) පිරිවැය රු.7,227,023 කට ප්‍රමිතියෙන් තොර පුටු මිලදී ගෙන තිබූ අතර මෙම පුටු භෞතික පරීක්ෂාවේදී බොහෝ පුටුවල රබර් බුස්, අත්ල, කුෂන් ගැලවී තිබුණ අතර පුටුවේ වාඩිවන කොටසේ යටි පැත්ත ස්ටේප්ලර් කටු ගසා ආවරණය කර තිබුණු අතර මිලදී ගත් මේස නිසි ප්‍රමිතියෙන් තොර බව නිරීක්ෂණය විය.

## 3.6 නේවාසිකාගාර ප්‍රතිසංස්කරණය හා පාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් රු මිලියන 22 ක වැයකර ප්‍රතිසංස්කරණය කරන ලද අක්කර 01 රූඩ් 01 පර්චස් 32.58 ක භූමියක පිහිටි සිසුන් 500 කට පමණ නේවාසික පහසුකම් සැපයිය හැකි තෙලවල නේවාසිකාගාරය 2010 වර්ෂයේ සිට වසාදමා තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට මෙහි වත්කම්වල පිරිවැය රු.25,352,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණ අතර මෙම නේවාසිකාගාරය කාන්තා නේවාසිකාගාරයක් බවට පත්කිරීම සඳහා 2013 අප්‍රේල් මාසයේ සිට අළුත්වැඩියා කටයුතු ආරම්භකර ඇති බව උපකුලපතිවරයා දන්වා තිබුණි.

(ආ) නේවාසිකාගාර කිහිපයක අසාමාන්‍ය ජල පරිභෝජනයක් වූ අතර ඒක ශිෂ්‍ය ජල පරිභෝජනය රු.2,317 සිට රු.9,861 ක පරාසයක් තුළ විහිදුණි.

(ඇ) නේවාසිකාගාර කිහිපයක අසාමාන්‍ය විදුලි පරිභෝජනයක් වූ අතර ඒක ශිෂ්‍ය විදුලි පරිභෝජනය රු.1,341 සිට රු.8,953 ක පරාසයක් තුළ විහිදුණි.

(ඈ) ග්‍රීන්පාත් භික්ෂු නේවාසිකාගාරයෙහි සිසුන් 50 කට පමණ නේවාසක පහසුකම් සැපයිය හැකි නේවාසිකාගාරය මාසයකට රු.130,000 ක කුලී පදනමට ලබාගෙන තිබුණි. 2011 ජුලි 01

දින ඒකාබද්ධ මාසික කුලිය රු.205,000 ගෙවා යාබද ගොඩනැගිල්ලක්ද ලබාගෙන තිබූ අතර 2012 මැයි වන විට සිසුන් 37 කට පමණක් නේවාසික පහසුකම් සපයා තිබුණි. එක් නේවාසිකාගාරය පමණක් මෙම භික්ෂු ශිෂ්‍යයන්ට නේවාසිකව සිටිය හැකිව තිබුණි.

## 04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 ක්‍රියාකාර් සැලැස්ම

2012 වර්ෂය සඳහා වූ ක්‍රියාකාර් සැලැස්මේ රු.9,026,077 ක් වූ උද්‍යාන අලංකරණ ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

### 4.2 ප්‍රසම්පාදන කටයුතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(අ) සහ 4.2.3 මාර්ගෝපදේශ ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක කාලපරිච්ඡේදයක් තුළ ඉටුකිරීමට අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ සැලැස්මේ ඒ ඒ ප්‍රසම්පාදන සැලැස්මේ කාලරාමුව හා පියවරයන් ඇතුළත් වන ප්‍රසම්පාදන කාලසටහන සකස්කර නොතිබුණි.

(ආ) ඉහත මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.3.2 මාර්ගෝපදේශය පරිදි අරමුදල් සම්පාදන මාර්ගය කුමක් වුවත්, සියළු ප්‍රසම්පාදන කටයුතු එකී සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය පරිදි ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු.84,276,916 ක් වූ මිලදීගැනීම් එක සැලැස්මට ඇතළත් කර නොතිබුණි.

### 4.3 කාර්යය මණ්ඩල පරප්පාඩු

විශ්වවිද්‍යාලයේ සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු 216 ක් විය. ඒ අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 136 ක් වූ අතර ඉන් 73 ක් සප්තවාර්ෂික නිවාඩු ලබාගෙන තිබණි. සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලය විසින් බාහිර කථිකාචාර්යවරුන් සඳහා රු.12,264,835 ක වැය බරක් දරා තිබුණි.

## 05. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට වරින්වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) මිලදීගැනීම්
(ආ) කොන්ත්‍රාත් පාලනය
(ඇ) පුස්තකාල පරිපාලනය
(ඈ) ගිණුම්කරණය
(ඉ) පාඨමාලා ආදායම්